
# උචිත තාක්ෂණය ගොවිපලට එයි

## ගොවි උපකරණ ගැන අත්හදා බැලීම්

**උචිත තාක්ෂණයේ අවශ්‍යතාවය පිළිබඳව වසර ගණනාවක් තිස්සේ කතාබහ කෙරේ. එය අපේ රටේ සංවර්ධනයට යොදා ගැනීම පිළිබඳව උණුසුම් විවාදද ඇතිවිය. එහෙත් එයට අමතරව මෙය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ප්‍රශ්නයකි. කෘෂිකාර්මික අංශයෙන් එයට පිළිතුරු මේ ලිපියෙන් විස්තර වෙයි.**

මෙරටේ කෘෂිකාර්මික කට යුතු දියුණු කිරීමට ඇති එක් බාධා වක් නවමත් මිනිස් ශ්‍රමය විශාල වශයෙන් වැය කිරීමට සිදුවීමයි. එහෙයින් අඩු ශ්‍රමයක් වැයකර වැඩි කාර්ය ප්‍රමාණයක් සිදු කළ හැකි උපකරණ පාවිච්චි කිරීමට සිදුවේ. මෙලෙස සරල ගොවි උප කරණ පාවිච්චි කිරීමෙන් කලට වේලාවට වගා කටයුතු කර ගැනී මට හැකිවන අතර, අපහසු කාර්ය යන් කිරීමද පහසු වෙයි.

මෙබඳු ගොවි උපකරණ තෝරා ගන්නා විට කරුණු කිහිපයක් සැලකිල්ලට ගත යුතුය. එවයින් කළහැකි වැඩ ප්‍රමාණය, ක්‍රියාකර වීමට නඩත්තුවට වැයවන මුදල් හා ඉන් ලැබෙන පහසුව මේ කරුණු අතර වේ. මෙයින් සමහර ගොවි උපකරණ මිනිස් ශ්‍රමයෙන් හෝ සතුන් ලවා ක්‍රියාකරවිය හැකියි. එහෙයින් ඒවා භාවිතයට වැයවන වියදම අඩුය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහඉලුප්පල්ලම ගොවිපල යාන්ත්‍රිකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මෙබඳු නව සරල ගොවි උපකරණ නිපදවීමේ පර්යේෂණ ක්‍රියාවලියක නිරත වී සිටී. ඒවා බොහොමයක් සරල නිසා තමන් ලබන අත්දැකීම් අනුව, ගොවි මහතුන්ට තමන් ගේම අත්දැකීම් අනුව ගමේ කම්මලේදීම මෙම උපකරණ වලින් සම හරක් නිපදවා ගත හැකිය.



ක්ෂේත්‍රයෙහි ක්‍රියා කරවා සාර්ථක ප්‍රතිඵල ලැබී ඇති මෙම උප කරණ පිළිබඳ විස්තර එම මධ්‍යස්ථානයෙන් ලබාගත හැකිය. ඉන් සමහරක් පිළිබඳ විස්තර පහත සඳ හන් වෙයි.

## බිම් සැකසීමට ප්‍රයෝජනවත් සරල උපකරණ

### සැහැල්ලු යකඩ නගුල

වියළි තත්වයෙන්ම මඩකළ පසෙහිද යෙදවිය හැකි ආකාරයේ සැහැල්ලු යකඩ නගුල් වර්ගයක් ඇත. දේශීය නගුල් වෙනුවට, මෙම සැහැල්ලු යකඩ නගුල් භාවිතය පහසුය. සුදුසුය. මෙම සැහැල්ලු යකඩ නගුල් වලින් සීසාන විට වල් පැල සහ ඉපනැල්ල හොඳින් පෙරලී පසට යටවෙයි. ගොඩ ඉඩම් වල පස වියළි තත්වය යටතේ සීසාන විට පසෙහි අවශ්‍ය තෙතමනය තිබුණොත් ඉතා හොඳින් පස පෙරලීමට මෙම නගුල් ප්‍රයෝජනවත්ය.

### සැහැල්ලු යකඩ නගුල් පිළිබඳ තොරතුරු

සීසැහැකි ගැඹුර – අඟල් 2 සිට 6 දක්වා

හීවිටේ පළල – අඟල් 5

නගුලක බර – කිලෝ ග්‍රෑම් 10


නගුලකින් දිනකට සීසෑම කළ හැකි ප්‍රමාණය – අක්කර 1/2

බලය – ගවයන් එක බානයි.

අවශ්‍ය ශ්‍රමය – එක් අයෙකු පමණයි.

### ගවයන් ලවා අද්දවන නගුල්රාමුව

මෙම උපකරණය මහ ඉලුප්පල්ලම ගො. යා. ප. මධ්‍යස්ථානයේදී අත්හදා බලා සාර්ථක ප්‍රතිඵල ගෙන දී ඇත. ගොඩ ඉඩම් සීසෑමට මෙම උපකරණය කදිමය. හැඩ නගුලක් හෝ දැති නගුලක් මෙයට අමුණා ප්‍රයෝජනයට ගත හැක. උපකරණයට සවිකර ඇති රෝදය අවශ්‍ය පරිදි එසවීමෙන් සීසෑමේ ගැඹුර වෙනස් කළ හැක. මෙම උපකරණය අතුරුයත් ගැමටද ප්‍රයෝජනවත්ය.




### වැදගත් තොරතුරු

සීසෑමේ ගැඹුර අඟල් 2 සිට 4 දක්වා හී වටේ පළල-වෙනස් කළ හැක. බර – දැති 4 ක් සමඟ බර කිලෝග්‍රෑම් 35 දිනකදී අක්: 5/8 ක සීසෑම කළහැක. ක්‍රියාකරවීම ගවයන් බානක් යෙදීමෙනි. එක් අයෙකුට මේ උපකරණය ක්‍රියා කරවිය හැක.


### ගවයන් ලවා අද්දවන මට්ටම් පෝරුවක් සහ වප්කර සහ බීජ සිටුවන යන්ත්‍ර

#### 1. මහ ඉලුප්පල්ලම වප්කරය

බෝග වර්ග කීපයක බීජ වැපිරිය හැකි වනසේ මෙම වප්කරය නිපදවා ඇත. ගොඩ ඉඩම් වලද වවන බෝගවල බීජ වැපිරීමට මෙම වප්කරය ප්‍රයෝජනවත්ය. සිටුවීමේ ගැඹුර අඟල් 1, 1/2 සිට දක්වා වුවද, මෙය ගොවියාට අවශ්‍ය පරිදි වෙනස්කර ගත හැක. එක් අයෙකුට ක්‍රියාකරවීමට හැකි මෙම යන්ත්‍රයෙන් දිනකදී අක්කර 1, 1/2 ක පමණ බීජ වැපිරිය හැක. මෙම වප්කරය නිපදවීමේ වියදම රු: 180/– ක් පමණ වේ. මෙම වප්කර තොග වශයෙන් නිපද වුවහොත් මේ වියදම තවදුරටත්, අඩුකර ගත හැක. මේ වප්කරයෙන් තල-බඩ ඉරිඟු-කුරහන්-සෝයා බෝංචි-කව්පි-රටකජු මෙන්ම වී පෙලට වැපිරිය හැක.

පහත සඳහන් වප්කර භාවිතයද නිර්දේශ කළ හැක.

1. ජෝන්පුල්ලෙ වප්කරය (කුඹුරුවල) වී පෙලට වැපිරීමට දිනකදී අක්: 3/4 ක බීජ පෙලට වැපිරිය හැක.
2. ජෝන්පුල්ලේ (ගොඩ ඉඩම්) වප්කරය. මෙය ගොඩ ඉඩම් වල කැකුලමට වී වැපිරීමට සුදුසුය.



**වප්කරය (1 වන වර්ගය)**

එකක බර (කිලෝ ග්‍රෑම්) – 18
වරකට බීජ වපුරන පේලි ගණන
–2 (දෙකයි)

බීජ සිටුවන ගැඹුර (අඟල්) – 1, 1/2-2 (වෙනස් කළහැක)

පේලි අතර පරතරය (අඟල්) 4–18 (වෙනස් කළහැක)

පේලියේ පරතරය –''2–6'' (වෙනස් කළහැක)

අවශ්‍ය ක්‍රියාකරුවන් සංඛ්‍යාව –එක්කෙනයි.

එකක මිළ – රු: 180/–

**වප්කරයක (2 වන වර්ගය)**


එක පේලියක පමණක් බීජ වැපිරීමට සකස් කර ඇති මෙම වප්කරය වෙනත් සියලු අංගවලින් 1 වර්ගයේ වප්කරයට සමානය. එහෙත් මෙය නිර්මාණය කර ඇත්තේ වැටි මත බීජ වැපිරීමටය.

**ගොයම් පැල සිටුවන යන්ත්‍රය**

අන්තර් ජාතික සහල් පර්යේෂණ ආයතනය නිපදවූ ගොයම්පැල සිටුවන යන්ත්‍රයේ, මෙරට තත්ත්වයට ගැලපෙනසේ වෙනස්කර, ගො.යා.ප. මධ්‍යස්ථානයේදී නිපදවන ලදී. මෙම යන්ත්‍ර වර්ග දෙකක් නිපදවා ඇත. එක් ආකෘතියක් පේලි අතර 6'' පරතරයට පේලි 6 ක් සිටුවිය හැකි යන්ත්‍රයකි.


දෙවන ආකෘතිය, පේලි අතර 8'' පරතරය පේලි 6 ක් සිටුවනා යන්ත්‍රයකි.

වැඩි දියුණුකළ ඩැපොග් තවාන් පැල සිටුවීමට මේ යන්ත්‍ර සුදුසුය. අක් උදව් කාරයකුගේ සහාය ලබමින් මෙම යන්ත්‍රය ක්‍රියා කරවන්වන්නට දිනකදී අක්කර 1/2 ක ගොයම් පැල සිටුවිය හැක. මෙම යන්ත්‍ර නිෂ්පාදනය දේශීය කර්මාන්තකරුවන් කීප දෙනෙකු ආරම්භ කර ඇත. මෙම යන්ත්‍ර පිළිබඳ තොරතුරු මහ ඉලුප්පල්ලම ගො. යා. ප. මධ්‍යස්ථානයෙන් ලබාගත හැක.



# ගො. යා. ප. මධ්‍යස්ථානයේ ගොයම් පැල සිටුවීමේ යන්ත්‍රය පිළිබඳ තොරතුරු

| | පළමුවන ආකෘතිය | දෙවන ආකෘතිය | අතින් පැල සිටුවීම |
|---|---|---|---|
| යන්ත්‍රයේ බර | කි. ග්‍රෑ. 31 | කි. ග්‍රෑ. 33 | —— |
| පැල සිටුවන ගැඹුර | සෙමි 2–5 | සෙමි 2–5 | —— |
| පේළි අතර පරතරය | සෙමි 20 | සෙමි 15 | |
| එක් අයෙකුට දිනකට පැල සිටුවිය හැකි වපසරිය | හෙක් 0.25 | හෙක් 0.25 | 0.04 |
| ශක්තිය | ක්‍රියාකරුවන් 1 | ක්‍රියාකරුවන් 1 | —— |
| පැල ඉදිරීමට, ප්‍රවාහනයට අවශ්‍ය ශ්‍රමය, හෙක්ටාර් 1 ට මිනිස් දින | 5 | 5 | 20 |
| හෙක්ටාර් 1 සිටුවීමට මුලු වියදම | රු: 560/- | රු: 566/- | රු:1 050 |
| ඉතිරි කරගත හැකි කාලය (මිනිස් දින) | 31 | 31 | —— |




1. ජපන් වල් නෙලන යන්ත්‍රය.
2. ගො.යා.පු.ම. වල් නෙලන යන්ත්‍රය.
3. ඇණ විඩරය (වල් පැල බහුල නොවන ලියදිවල භාවිතයට සුදුසුය)

**වල් නෙලන සහ අතුරුයත් ගෑමේ උපකරණ**

ගොඩ ඉඩම්වල වී වගාවල වල් පැල මර්දනය කිරීමට පහත සඳහන් උපකරණ නිර්දේශ කළ හැක.

1. සවිස් හෝ (58 වන පිටුව බලන්න)
2. අතින් අදින
3. රෝද

පහත සඳහන් වල් නෙලන යන්ත්‍ර මඩ කුඹුරුවල පෙළට වපුරා හෝ පෙලට පැල සිටුවා ඇති ගොයමේ වල් පැල මර්දනයට සුදුසුය.



**ගොයම් පාගන යන්ත්‍ර**

යන්ත්‍ර මගින් ගොයම් පෑගීම–දේශීය ගොයම් පෑගීමේ ක්‍රම වලට වඩා සුදුසුය. යන්ත්‍ර මගින් ගොයම් පෑගීමෙන් ධාන්‍ය අපතේයාම අඩු කර හැක.

අන්තර් ජාතික සහල් නිෂ්පාදන ආයතනය නිපදවූ ගොයම් පාගන යන්ත්‍රයට අනුරූපව–දේශීය තත්වයට සරිලන ගොයම් පාගන යන්ත්‍රයක් මහ ඉලුප්පල්ලම ගො. යා. ප. මධ්‍යස්ථානයේ නිපදවා ඇත. මෙම යන්ත්‍රය අත්හදා බැලූ ගොවි මහතුන් මෙම යන්ත්‍ර ගැන සතුටට පත්වූහ. පහසුවෙන්, ගෙන යා හැකි කුඩා ගොයම් පාගන යන්ත්‍ර මෙරට නිෂ්පාදකයන් නිපදවා ඇත.

මෙම යන්ත්‍ර සැලකිය යුතු සංඛ්‍යාවක් දැනටමත් ගොවිමහතුන් අතට පත්ව තිබේ.